# දැනුම්දීමයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී. හි තැන්පතුකරුවන් වෙත කෙරෙන දැනුම්දීමයි.

සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී. වෙත මුදල් ව්‍යාපාර කටයුතු සඳහා නිකුත් කර තිබූ බලපත්‍රය 2018 මාර්තු 05 වන දින අවලංගු කරන ලද අතර ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ රෙගුලාසි වලට යටත්ව එක් තැන්පතුකරුවෙකුට උපරිමය රු. 1,100,000.00 කට යටත්ව වන්දි ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගන්නා ලදී.

2021 අංක 02 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රම රෙගුලාසිවලට අනුව සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී. හි තැන්පත්කරුවන්ගෙන් **අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2022 මාර්තු** 05* වන දින වේ.

රක්ෂණ වන්දි ලැබීමට සුදුසුකම් ලැබූ නමුත් තවමත් රක්ෂණ වන්දි ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර නොමැති සියලුම සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී. තැන්පත්කරුවන් / නීත්‍යානුකූල හිමිකම්ලාභීන් නිසි ලෙස සම්පූර්ණ කරන ලද **හිමිකම් පෑමේ අයදුම්පත සහ ප්‍රකාශය / කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය අදාල අයදුම්පත් වල දක්වා ඇති උපදෙස් හි සඳහන් වන නියමිත ලිපි ලේඛන ද සමඟ 2022 මාර්තු** 05 වන දින හෝ ඊට පෙර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැපැල් කාමරය වෙත ගෙනවිත් භාර දීම හෝ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම කල යුතු වේ. තවද, අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "CIFL" ලෙස සඳහන් කල යුතුය.

'හිමිකම් අයදුම්පත සහ ප්‍රකාශය' / 'කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය' ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙන්, මාතලේ, මාතර, අනුරාධපුර, ත්‍රිකුණාමලය, නුවරඑළිය සහ කිලිනොච්චිය යන ප්‍රාදේශීය කාර්යාලවලින් මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය වන "https://www.cbsl.gov.lk/en/public-notices" වෙතින්ද ලබාගත හැකිය.

**වැඩිදුර විස්තර සඳහා අමතන්න: 011 2477261, 011 2398788, 011 2477273**

* 2022 මාර්තු 05 වන දිනට පෙර සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී. ආයතනය ඈවර කිරීම සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් ඈවරකරුවෙකු පත් කරනු ලැබුවහොත්, ඈවරකරු පත් කරන දිනය හිමිකම් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය වේ.

**අධ්‍යක්ෂ**
**නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**නො.30, ජනාධිපති මාවත, කොළඹ 01.**